## 2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

1. මේ පනත 2012 අංක .......දරණ බුද්ධිමය දේපල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. **2003 අංක 36 දරණ බුද්ධිමය දේපල පනතේ (මෙහි මින්මතු ප්‍රධාන ප්‍රඥප්තිය වශයෙන් නම් කරනු ලබන) 2 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.**

(ආ) ප්‍රදර්ශන, තරඟ, සම්මන්ත්‍රණ සහ ප්‍රකාශන සංවිධානය කිරීමෙන් සහ මේ පනතේ II වන කොටස යටතේ පිළිගත් ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ පරිපාලනය කිරීම සඳහා සංවිධාන හෝ සංගම් පිහිටුවීමෙන් සහ ඒවායේ මනා ක්‍රියාකාරිත්වය ප්‍රවර්ධනය කිරීමෙන් හා ඒවාට ධෛර්ය දීමෙන් ප්‍රකාශන අයිතිය හා සම්බන්ධිත අයිතිවාසිකම් ඇතුළත්ව බුද්ධිමය දේපල විෂයය පිළිබඳව ජාතික දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම හා දිරිමත් කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම,

අධ්‍යක්ෂ ජනරාල්වරයා සතු වන්නේය.

3. **ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ " මහජනයාට සංනිවේදනය " හා " පළ කරන ලද " යන අර්ථනිරූපනයන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථනිරූපනයන් ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

**" මහජනයා වෙත සංනිවේදනය කිරීම " යන්නෙන්, යම් කෘතියක්, රංගනයක් හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක් මහජනයා වෙත ලැබීමට සැලැස්වීම ඇතුලුව, යම් කෘතියක, රංගනයක හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක ප්‍රතිබිම්බ හෝ ශබ්ද හෝ ඒ දෙකම මහජන සාමාජිකයන් විසින් තනි තනිව තෝරාගත් ස්ථානයකදී හා වේලාවක දී ප්‍රවේශය ලැබිය හැකි ආකාරයට රැහැන් මගින් හෝ රැහැන් රහිතව මහජනයා වෙත සම්ප්‍රේක්ෂණය කිරීම අදහස් වේ.**

" පළ කරන ලද " යන්නෙන් -

(අ) කෘතියක හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක සාධාරණ පිටපත් සංඛ්‍යාවක් අලෙවි කිරීම, කුලියට දීම, මහජනයාට බැහැර දීම හෝ පිටපත්වල අයිතිය හෝ සන්තකය පවරා දීම සඳහා මහජනයා වෙත ලැබීමට සැලැස්වීම; හෝ

(ආ) කෘතියක් හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක් විද්‍යුත් මාධ්‍යයක් මගින් මහජනයා වෙත ලැබීමට සැලැස්වීම; අදහස් කෙරේ.

කෙසේ වෙතත් මහජනයා වෙත ලැබීමට සැලැස්වීම සිදු වූයේ කෘතියක දී නම් එහි ප්‍රකාශන අයිතියේ හිමිකරුගේ එකඟත්වය ඇතිව ද, ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමකදී නම් එහි නිෂ්පාදකයාගේ හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයාගේ එකඟත්වය ඇතිව ද විය යුතු ය.

4. **ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(ආ) අන්තර්ගත කරුණු තෝරා ගැනීම, සම්බන්ධීකරණය හෝ එකලස් කර ඇති ආකාරය හේතුවෙන් මුල් කෘතියක් බවට පත්වන කෘතීන්හි, ඒවා යාන්ත්‍රිකව කියවනු ලැබිය හැකි හෝ වෙනත් ස්වරූපයක වුව ද, එකතු සහ හුදෙක් දත්ත එකතු (දත්ත පදනම්).

5. **ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) 11 වන වගන්තියේ සිට 13 වන වගන්තිය දක්වා වගන්තිවල විධිවිධානවලට යටත්ව, ප්‍රකාශන අයිතිය හිමිකරුට, ඒ කෘතිය සම්බන්ධයෙන් පහත දැක්වෙන ක්‍රියාවන් කිරීමට හෝ ඒ ක්‍රියාවන් කිරීම සඳහා බලය පැවරීමට පරම අයිතිවාසිකම තිබිය යුතුය :-

(අ) කෘතිය ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ආ) කෘතිය පරිවර්තනය කිරීම ;

(ඇ) කෘතිය අනුවර්තනය කිරීම, සකස් කිරීම හෝ එහි වෙනත් විපර්යාසයන් සිදු කිරීම ;

(ඈ) විකිණීමෙන්, කුලියට දීමෙන්, අපනයනය කිරීමෙන් හෝ අන්‍යාකාරයකින් කෘතියේ මුල් පිටපත හෝ එක් එක් පිටපත් මහජනයා අතර බෙදා හැරීම ;

(ඉ) ශ්‍රව්‍ය දෘෂ්‍ය කෘතියක, ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ගැබ් වී තිබෙන කෘතියක, පරිගණක වැඩසටහනක, දත්ත පදනමක හෝ ස්වර සටහනක ස්වරූපයෙන් වූ සංගීත කෘතියක මුල් පිටපත හෝ පිටපතක් එහි මුල් පිටපතේ හෝ පිටපතේ අයිතිය නොසලකා කුලියට දීම ;

(ඊ) (ආනයනය කළ පිටපත් ප්‍රකාශන අයිතිය හිමිකරුගේ අවසරය ඇතිව සකස් කර තිබෙන අවස්ථාවක වුව ද) කෘතියෙහි පිටපත් ආනයනය කිරීම;

(උ) කෘතියේ මුල් පිටපත හෝ පිටපතක් මහජනයා සඳහා ප්‍රදර්ශනය කිරීම ;

(ඌ) කෘතිය ප්‍රසිද්ධ රඟ දැක්වීම ;

(එ) කෘතිය විකාශනය කිරීම ; සහ

(ඒ) කෘතිය වෙනත් ආකාරයකින් මහජනයා වෙත සංනිවේදනය කිරීම.

6. **ප්‍රධාන ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(4) (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ කවර විධිවිධානයක් තිබුණ ද, කෘතියකින් නීත්‍යානුකූලව සකස් කරන ලද පිටපතක අයිතිකරුට හෝ එම අයිතිකරු විසින් තත් කාර්යය සඳහා බලය දෙනු ලැබූ යම් තැනැත්තකුට ප්‍රකාශන අයිතිය හිමිකරුගේ බලය නොමැතිව වුව ද ඒ පිටපත විකිණීමට හෝ අන්‍යාකාරයකින් බැහැර කරනු ලැබීමට හිමිකම් තිබිය යුතුය.

7. **ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (6) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(අ) කාලීන ආර්ථික, දේශපාලන හෝ ආගමික මාතෘකාවක් මත පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක, විකාශනයක හෝ මහජනයා වෙත සංනිවේදනය කිරීමේ වෙනත් ක්‍රමයක පලකරන ලද ලිපියක් පුවත්පතක හෝ වාර ප්‍රකාශනයක, විකාශනයක හෝ මහජනයා වෙත සංනිවේදනය කිරීමේ වෙනත් ක්‍රමයක ප්‍රතිනිෂ්පාදනය කිරීම; එම ප්‍රතිනිෂ්පාදනය කිරීම, විකාශනය කිරීම හෝ මහජනයා වෙත වෙනත් ආකාරයකින් සංනිවේදනය කිරීම එහි ප්‍රකාශන අයිතිය හිමිකරු විසින් එම පිටපත් මත හෝ එම කෘතිය විකාශනය කිරීමේදී හෝ වෙනත් ආකාරයකින් මහජනයා වෙත සංනිවේදනය කිරීමේදී ප්‍රකාශිතව රඳවා තබාගෙන ඇති අවස්ථාවකට එම අවසරය අදාළ නොවිය යුතුය ;

8. **ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ (3) සහ (4) වන උපවගන්තීන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තීන් ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(3) සාමූහික කෘතියක් සම්බන්ධයෙන් වන විට ඒ කෘතිය නිර්මාණය කර ඇත්තේ යම් කායික පුද්ගලයකුගේ හෝ නෛතික අස්තිත්වයක ක්‍රියාරම්භය මත හා මග පෙන්වීම යටතේ ද ඒ පුද්ගලයා හෝ නෛතික අස්තිත්වය ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය.

(4) කායික තැනැත්තකු හෝ නෛතික අස්තිත්වයක් විසින් සේවයේ නියුක්ත කර සිටින කර්තෘවරයකු විසින් එම සේවා නියුක්තියේ යෙදී සිටියදී නිර්මාණය කරනු ලැබූ කෘතියක් සම්බන්ධයෙන් වන විට, ගිවිසුමකින් අන්‍යාකාර විධිවිධාන සලසා නැතහොත්, සේවායෝජකයා ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතු ය. එම කෘතිය කර්තෘ ලවා බලය පැවරීමක් මත ඉටු කරවා ගත් නිර්මාණයක් වන්නේ නම්, ගිවිසුමකින් අන්‍යාකාර විධිවිධාන සලසා නැතහොත්, එම කෘතිය නිර්මාණය සඳහා බලය පැවරූ තැනැත්තා එම කෘතියේ ආර්ථික අයිතිවාසිකම්වල මුල් අයිතිකරු විය යුතුය.

9. **ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (1) සහ (2) වන උපවගන්තීන් ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තීන් ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) වාණිජ අරමුණු සඳහා පළ කරන ලද ශාබ්දික පටිගත කිරීමක් හෝ තැටිගත කිරීමක් හෝ එවැනි ශාබ්දික පටිගත කිරීමක හෝ තැටිගත කිරීමක ප්‍රතිනිෂ්පාදනයක් මහජනයා වෙත කෙලින්ම විකාශනය කිරීම සඳහා හෝ අන්‍යාකාරයකින් සංනිවේදනය සඳහා භාවිතා කළහොත් හෝ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කළහොත් එය එසේ ප්‍රයෝජනයට ගත් තැනැත්තා විසින් ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමට දායක වූ ඉදිරිපත් කරන්නාට හෝ ඉදිරිපත් කරන්නන්ට සහ ඒ ශාබ්දික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ නිෂ්පාදකයාට එක් සාධාරණීය පාරිශ්‍රමික ගෙවීමක් කළ යුතුය.

(2) ඉදිරිපත් කරන්නා හෝ කරන්නන් සහ නිෂ්පාදක අතර අන්‍යාකාර එකඟවීමක් නැතහොත්, (1) වන උපවගන්තිය යටතේ නිෂ්පාදකයාට ලැබෙන මුදල් ප්‍රමාණයෙන් අර්ධයක් නිෂ්පාදකයා විසින් ඉදිරිපත් කරන්නාට හෝ කරන්නන්ට ගෙවිය යුතු ය.

10. **ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව ජනප්‍රවාද ප්‍රකාශන -

(අ) ප්‍රතිනිෂ්පාදනය කිරීම ;

(ආ) ඉදිරිපත් කිරීම, විකාශනය කිරීම, කේබල් මගින් හෝ වෙනත් ක්‍රමයකින් විසුරුවා හැරීම මගින් මහජනයා වෙත සංනිවේදනය කිරීම ; හා

(ඇ) අනුවර්තනය, පරිවර්තනය හෝ වෙනත් ආකාරයක විපර්යාස කිරීම ;

යන ඕනෑම ක්‍රියාවක්, එම ක්‍රියාව වාණිජ අරමුණක් සඳහා හෝ සම්ප්‍රදායික හෝ ව්‍යවහාරගත සන්දර්භයෙන් බාහිරව හෝ කරනු ලැබීමට එරෙහිව ආරක්ෂා කරනු ලැබේ.

11. **ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (i) අනුඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(i) බලපත්‍ර නිකුත් කිරීමෙන් හෝ බලපත්‍ර ගාස්තු එකතු කිරීමෙන් හෝ ඒ දෙයාකාරයෙන්ම හෝ මෙම කොටස යටතේ පිළිගත් ඕනෑම අයිතිවාසිකමක් හෝ සියලුම අයිතිවාසිකම් පරිපාලනය කිරීම සඳහා එම අයිතිවාසිකම් හි හිමිකරුවන්ගෙන් අනන්‍ය බලයක් ලබා ගැනීමට සංගමයකට හැකි ය.

12. **ප්‍රධාන ප්‍රඥප්තියේ 25 වන වගන්තියෙන් අනතුරුව පහත දැක්වෙන අලුත් 25අ වගන්තිය එකතු කරනු ලැබේ.**

(25)අ (1) මෙම කොටස යටතේ ආරක්ෂා කෙරෙන කෘතීන් හා ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීම් හි නම් හෝ නාමයන් ද එම කෘතීන් හි කර්තෘවරුන්ගේ හා එහි ප්‍රකාශන අයිතියේ හිමිකරුවන්ගේ ද, ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීම් හි නිෂ්පාදකයන්ගේ ද, කෘතියක් ප්‍රකාශයට පත්කර ඇති විටක එහි ප්‍රකාශකයාගේ ද නම හා ලිපිනය ද, පනත යටතේ සාදනු ලබන නියෝගයන් මගින් දක්වා ඇති වෙනත් තොරතුරු ද වාර්තා කරනු ලබන "ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනය" නමින් හඳුන්වනු හා දැනගනු ලබන ලේඛනයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පහත දැක්වෙන පරිදි හා පනත යටතේ සාදනු ලබන නියෝග පරිදි පවත්වාගනිමින් නඩත්තු කළ යුතු ය.

(2) ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ ඇතුලත් කර ඇති හා පවතින තොරතුරු එසේ නොවේයයි ඔප්පුකරන තුරු නිවැරදි බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(3) කෘතියක කර්තෘ හෝ ප්‍රකාශන අයිතියේ හිමිකරු, ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක නිෂ්පාදක හෝ කෘතියක ප්‍රකාශක විසින් ඉහත (1) වන උපවගන්තියේ දැක්වෙන තොරතුරු ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ ඇතුළත් කිරීම සඳහා, නියම කරනු ලබන ආකාරයට හා ගාස්තුවට යටත්ව, අයදුම්පතක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ හැකි ය.

(4) (i) කෙසේ වෙතත් කෘතියක් හෝ කෘතියක හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක නම හෝ නාමය මෙම පනත යටතේ ලකුණක් ලෙස භාවිත කරන්නේ නම් හෝ කළ හැකි නම් අයදුම්පත සමඟ ඒ බැව් දැක්වෙන ප්‍රකාශයක් අයදුම්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතර එවන් කෘතියක් හෝ කෘතියක හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක නමට හෝ නාමයට සර්වසම හෝ නොමඟ යවන ආකාරයට සමාන ලකුණක් අයදුම්කරු හැර වෙනත් පුද්ගලයකුගේ නමින් අයදුම් කර නැති බව හා අයදුම්කරු හැර වෙනත් පුද්ගලයකුගේ නමින් ලියාපදිංචි කර නැති බව දක්වමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කරනු ලබන සහතිකයක් ද ඉදිරිපත් කළ යුතු ය.

(ii) නියමිත ආකාරයට හා නියමිත ගාස්තුව සමඟ කරනු ලබන අයදුම්පතක් ලැබීමෙන් පසු හා කෘතිය හෝ කෘතියේ හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමේ නම හෝ නාමය එසේ සර්වසම හෝ නොමඟ යවන සුලු ආකාරයට සමාන නොවන බවට සෑහීමට පත්වීමෙන් පසු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම සහතිකය නිකුත් කළ යුතු ය.

(iii) එකී කෘතිය හෝ කෘතියේ හෝ ශාබ්දික පටිගත කිරීමේ හෝ තැටිගත කිරීමේ නම හෝ නාමය එකී ආකාරයට සර්වසම හෝ සමාන වන්නේ නම් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එකී සහතිකය ඉල්ලීමේ අයදුම්පත ප්‍රතික්ෂේප කළ යුතු ය.

(5) ඉහත ප්‍රතිපාදන පරිදි කෘතියක් හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක් සම්බන්ධ අයදුම් පතක් ලැබුණ විට, තමන් සුදුසුයයි සලකනු ලබන ආකාරයේ පරීක්ෂණයක් පවත්වා, අදාල තොරතුරු මෙම වගන්තියේ (1) වන උපවගන්තිය මගින් ප්‍රතිපාදන සලසා ඇති ආකාරයට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ ඇතුලත් කළ යුතු ය.

(6) ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ තොරතුරු ලියාපදිංචි කිරීම ස්වේච්ඡාවෙන් සිදුවිය යුතු අතර, මෙම කොටසේ ප්‍රතිපාදන ප්‍රකාරව කෘතියක් හෝ ශාබ්දික පටිගත හෝ තැටිගත කිරීමක් ආරක්ෂා කිරීම සඳහා වූ අවශ්‍යතාවයක් නොවිය යුතු ය.

(7) එහි ඇතුළත් කර ඇති තොරතුරු සම්බන්ධයෙන් ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනය බැලූ බැල්මට සාක්ෂියක් වන්නේ ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සහතික කරන ලද එහි ඇතුලත් තොරතුරුවල පිටපත් හෝ ඒවායේ උද්ධෘතයන් ඕනෑම අධිකරණයක දී හෝ නඩු කටයුත්තක දී වෙනත් ඔප්පු කිරීමකින් තොරව හෝ මුල් පිටපත් ඉදිරිපත් කිරීමකින් තොරව සාක්ෂි ලෙස ඇතුලත් කළ යුතු ය.

(8) නියම කරනු ලබන ආකාරයට උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශවයක් විසින් කරනු ලබන ඉල්ලීමක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම්වල, නාමවල, ලිපිනවල හෝ වෙනත් තොරතුරක සත්භාවමය වැරදීමක් හෝ ප්‍රමාදදෝෂයක් නිසා ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ ඇතුලත් කර ඇති වරදක් නිවැරදි කළ හැකි ය.

(9) නියම කරනු ලබන ආකාරයට උනන්දුවක් දක්වන ඕනෑම පාර්ශවයක් විසින් කරන ලද ඉල්ලීමක් මත හා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සුදුසුයයි සලකන ආකාරයට පාර්ශවයන්ට කන්දීමෙන් පසු, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්

(අ) ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ තොරතුරු ඇතුලත් කිරීමේ දී සිදු වූ අකරණයක් නිවැරදි කිරීමෙන්; සහ

(ආ) එකී ලේඛනයට සාවද්‍ය ලෙස ඇතුලත් කර ඇති තොරතුරක් එකී ලේඛනයෙන් ඉවත් කිරීමෙන්; ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනය ප්‍රතිශෝධනය කළ හැකි ය.

(10) ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ ඇතුලත් කරන ලද සියලුම සටහන් කිරීම් ද සටහන් කිරීමක නිවැරදි කිරීම් හා ප්‍රතිශෝධනය කිරීම් ද මහජනතාවගේ දැනගැනීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රසිද්ධ කළ යුතු ය.

(11) ඕනෑම පුද්ගලයකුට, නියමකරනු ලබන ගාස්තුවකට යටත්ව ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනය පරීක්ෂා කළ හැකි අතර, නියම කරනු ලබන ගාස්තුවකට යටත්ව ප්‍රකාශන අයිතිය පිළිබඳ ලේඛනයේ කරන ලද සටහන් කිරීම්වල පිටපත් හෝ උද්ධෘතයන් ලබා ගත හැකි ය.

13. **ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(අ) නිෂ්පාදකයන් ශ්‍රී ලාංකික ජාතිකයන් වන ශාබ්දික පටිගත කිරීම් හෝ තැටිගත කිරීම් ;

14. **ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

30 මේ කොටසෙහි කාර්ය සඳහා, කාර්මික හෝ හස්ත කර්මාන්ත නිෂ්පාදනයකට විශේෂ පෙනුමක් ගෙන දෙන සහ කාර්මික හෝ හස්ත කර්මාන්ත නිෂ්පාදනයකට

මෝස්තරයක් ලෙස උපයෝගී කර ගත හැකි යම් රේඛා හෝ වර්ණ සංයුතියක් හෝ රේඛා හෝ වර්ණ ආශ්‍රිත වුවද හෝ නොවුව ද ත්‍රිමාන ආකෘතියක් කාර්මික සැලසුමක් ලෙස සැලකිය යුතුය ;

එසේ වුව ද, හුදෙක් තාක්ෂණික ප්‍රතිඵල ලබා ගැනීමෙහි ලා උපයෝගී වන කාර්මික සැලසුමක ඇති කිසිවක් මේ කොටස යටතේ ආරක්ෂා නොකළ යුතු ය.

15. **ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(2) ඉල්ලුම්කරු 36 වන සහ 38 වන වගන්තිවල විධිවිධාන අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක, කාර්මික සැලසුම ලියාපදිංචි කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කළ යුතුය ;

එසේ වුව ද, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඉල්ලුම් පත්‍රයෙහි ඇති යම් දෝෂයක් ගැන ප්‍රථමයෙන් ඉල්ලුම්කරු වෙත නිවේදනය කළ යුතු අතර, ඒ නිවේදනයේ දින සිට මාස තුනක් ඇතුලත ඒ දෝෂය නිදොස් කිරීම සඳහා අවස්ථාවක් ඉල්ලුම්කරුට සලසා දිය යුතු ය.

16. **ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

50 පාර්ශවකරුවන් අතර යම් පටහැනි එකඟවීමක් නොමැති විටක, කාර්මික සැලසුමක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක හෝ කාර්මික සැලසුමක ලියාපදිංචියක හවුල් හිමිකරුවන් විසින් වෙන් වෙන් වශයෙන් ඉල්ලුම් පත්‍රය හෝ ලියාපදිංචිය පිළිබඳ ඔවුන්ගේ අයිතිවාසිකම් පාවාදීම හෝ අන්සතු කිරීම ද, කාර්මික සැලසුම පාවිච්චි කිරීමද, 47 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) තෙක් වූ ඡේදවල සඳහන් තමන්ටම හිමි වූ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම ද කරනු ලැබිය හැකි නමුත් ඉල්ලුම් පත්‍රය ඉල්ලා අස්කර ගැනීම ද, ලියාපදිංචිය අත් හැරීම ද, කාර්මික සැලසුම හා සම්බන්ධ බලපත්‍ර ගිවිසුමකට ඇතුලුවීම ද හවුලේ පමණක් කරනු ලැබිය හැකිය.

17. **ප්‍රධාන ප්‍රඥප්තියේ 62 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) මේ කොටසේ කාර්ය සඳහා "නව නිපැයුම" යන්නෙන් ඕනෑම තාක්ෂණ විද්‍යා ක්ෂේත්‍රයක නිශ්චිත ගැටළුවක් විසඳීමට ව්‍යවහාරයෙහි ලා උපකාරී වන, නව නිපැයුම්කරුවකුගේ සංකල්පනාවන් අදහස් වේ.

18. **ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

64.(1) නව නිපැයුමක් පූර්ව කලාව මගින් කලින් පෙන්නුම් කර නොමැති නම්, එය අලුත් ලෙස සැලකිය යුතු ය.

(2) පූර්ව කලාව -

(අ) නව නිපැයුමට හිමිකම් ඉල්ලා සිටින පේටන්ට් බලපත්‍රය සඳහා ඉල්ලුම් පත්‍රය ගොනු කිරීමට පෙර හෝ උචිත අවස්ථාවකදී ඒ ඉල්ලුම් පත්‍රයේ ප්‍රමුඛත්ව දිනයට පෙර,
ලෝකයේ කවර ස්ථානයක දී වුව ද, ලිඛිත ප්‍රකාශයක් මගින්, වාචික අනාවරණයක් මගින්, භාවිතයෙන් හෝ වෙනත් ඕනෑම මාර්ගයකින් මහජනයාට අනාවරණය කළ සියලු දෙයින් ;

(ආ) මෙහි (අ) ඡේදයේ සඳහන් පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ගොනු කරනු ලැබූ හෝ උචිත අවස්ථාවක දී ඒ ඉල්ලුම් පත්‍රයට වඩා කලින් ප්‍රමුඛත්ව දිනයක් ලත් ශ්‍රී ලංකාවේ ගොනු කරනු ලැබූ පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයක අඩංගු කරුණු එකී ශ්‍රී ලංකාවෙහි ගොනු කළ පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රය පදනම් කරගෙන ප්‍රදානය කරනු ලබන පේටන්ට් බලපත්‍රයෙහි ඇතුළත් වන ප්‍රමාණයකට, ඒ කරුණුවලින්,

සමන්විත වන්නේය.

(3) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ කරනු ලබන අනාවරණයක් -

(අ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුවම වූ අවුරුද්දක් ඇතුළත සිදු වූවක් නම් සහ ඉල්ලුම්කරු විසින් හෝ ඔහුගේ පූර්වගාමියා විසින් හෝ කරන ලද ක්‍රියා හේතුකොටගෙන හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් හෝ සිදුවූවක් නම් ;

(ආ) ඒ අනාවරණය කිරීම පේටන්ට් බලපත්‍ර ඉල්ලුම් පත්‍රයේ දිනයට පෙරාතුවම වූ මාස හය ඇතුළත සිදුවූවක් නම් සහ ඉල්ලුම්කරුගේ හෝ ඔහුගේ පූර්වගාමියාගේ අයිතිවාසිකම් වෙනත් පාර්ශවයක් විසින් අනිසි ලෙස ක්‍රියාත්මක කිරීමේ හේතුව නිසා හෝ ප්‍රතිවිපාකයක් නිසා හෝ සිදුවූවක් නම්;

නොසලකා හැරිය යුතු ය.

19. **ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

65 නව නිපැයුමට හිමිකම දක්වන පේටන්ට් බලපත්‍රය සඳහා වූ ඉල්ලුම් පත්‍රයට අදාළ පූර්ව කලාව සැලකිල්ලට ගෙන බලන කල්හි, එම කලාව පිළිබඳ සාමාන්‍ය නිපුණතාවක් ඇති තැනැත්තකුට නව නිපැයුමේ තිබෙන නව නිපැයුම්කාරී පියවර පිළිබඳව පැහැදිලි ලෙස නොපෙනේ නම් ඒ නව නිපැයුමේ නව නිපැයුම්කාරී පියවරක් තිබෙන බව සැලකිය යුතුය.

20. **ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) යම් සේවා නියුක්ති ගිවිසුමක හෝ වැඩක් ඉටු කිරීමට සඳහා වූ ගිවිසුමක හෝ පටහැනි විධිවිධානයක් නොමැති විටක, ඒ සේවා නියුක්ති ගිවිසුම ක්‍රියාත්මක

කිරීමේ දි හෝ ඒ වැඩය ඉටු කිරීමේ දී කරන ලද නව නිපැයුමක් සඳහා පේටන්ට බලපත්‍රයක් ලබා ගැනීමට ඇති අයිතිවාසිකම, අවස්ථාවෝචිත පරිදි, සේවායෝජකයාට හෝ ඒ වැඩය භාරදුන් තැනැත්තාට හෝ උපචිත වෙතැයි සැලකිය යුතු ය :

එසේ වුවද, අවස්ථාවෝචිත පරිදි සේවා නියුක්ති ගිවිසුමට හෝ ඒ වැඩය ඉටු කිරීම සඳහා වූ ගිවිසුමට හෝ ඇතුළත් වූ අවස්ථාවේ දී පාර්ශවකරුවන්ට කල්තියා සාධාරණව දැන ගැනීමට හැකි වූ ආර්ථික වටිනාකමට වැඩි ආර්ථික වටිනාකමක් ඒ නව නිපැයුමට ඇති වන අවස්ථාවක, පාර්ශවකරුවන් අතර පාරිශ්‍රමිකයක් පිළිබඳ එකඟත්වයක් නොමැති නම්, ඒ වෙනුවෙන් අධිකරණය වෙත කරන ලද ඉල්ලීමක් මත අධිකරණය විසින් කරනු ලැබිය හැකි සාධාරණීය පාරිශ්‍රමිකයක් ලැබීමට නව නිපැයුම්කරුට හිමිකම ලැබිය යුතු ය.

21. **ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) උපඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(ii) නව නිපැයුම පිළිබඳ විස්තරයක්.

22. **ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ (ii) උපඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(ii) නව නිපැයුමේ නාමය.

23. **ප්‍රධාන ප්‍රඥප්තියේ 71 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(3) අදාළ තාක්ෂණය පිළිබඳව සාමාන්‍ය නිපුණත්වයක් ඇති තැනැත්තකු විසින් නව නිපැයුම ඇගැයීම සහ ක්‍රියාවට නැගීම සඳහා ප්‍රමාණවත් ලෙස පැහැදිලි වූ සහ පූර්ණ වූ ආකාරයකින් නව නිපැයුම එකී විස්තරයෙන් අනාවරණය කළයුතු අතර, විශේෂයෙන්ම නව නිපැයුම ක්‍රියාවට නැගීම සඳහා ඉල්ලුම්කරු දන්නා අවම වශයෙන් එක් ක්‍රමයක් එහි දැක්විය යුතු ය.

24. **ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) (අ) සෑම ඉල්ලුම්කරුවකු විසින්ම නියමිත කාල සීමාව ඇතුළත හා නියම කරනු ලැබිය හැකි පරිදි සෝදිසි වාර්තාවක් සැපයිය යුතු අතර, එය ඉංග්‍රීසි භාෂාවෙන් සකස් කර නොමැති නම්, එය සමඟ එහි ඉංග්‍රීසි පරිවර්තනයක් ඉදිරිපත් කළ යුතුය :

(ආ)(i)එසේ වුවද, ඉහත (අ) ඡේදයේ දැක්වූ සෝදිසි වාර්තාව වෙනුවට, ඉල්ලුම් පත්‍රය දේශීය පරීක්ෂකවරයකු වෙත යොමු කරන ලෙස ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන්, නියමිත ගාස්තුව ගෙවීමට යටත්ව, ඉල්ලා සිටිය හැකිය. එවන් ඉල්ලීමක් ලැබුණ විට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එවන්

අයදුම්පතක් දේශීය පරීක්ෂකවරයෙකුට යොමු කළයුතු අතර, ඒ දේශීය පරීක්ෂකවරයා විසින් හිමිකම් පෑම හෝ පෑම් පදනම් කොටගෙන ද, විස්තරය නිසි සැලකිල්ලට ගනිමින් ද, නව නිපැයුම පරීක්ෂා කර බලා පූර්ව කලාව පිළිබඳව ද, ඔහුගේ අදහසට අනුව නව නිපැයුම පේටන්ට් බලපත්‍රයක් ලැබීමට සුදුසුද යන්න පිළිබඳව ද, වාර්තාවක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(ii)එම දේශීය පරීක්ෂකවරයා පහසුකම් ඇති ආකාරයට අදාළ පූර්ව කලාව හැකිතාක් දුරට අනාවරණය කර ගැනීමට උත්සාහ දැරිය යුතු අතර මේ අරමුණ සඳහා දේශීය පරීක්ෂකවරයා පූර්ව කලාව පිළිබඳ තමාට ඇති සියලුම තොරතුරු මූලාශ්‍රයන් අධ්‍යයනය කළ යුතු ය.

25. **ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඉ) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේද ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(අ) 71 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නියමයන් ;

(ආ) අදාල වන අවස්ථාවක, 71 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ නියමයන් ;

(ඉ) 73 වන වගන්තියෙහි සඳහන් සෝදිසි වාර්තා දෙකින් එකක් ඉදිරිපත් කර තිබීම.

26. **ප්‍රධාන ප්‍රඥප්තියේ 79 වන වගන්තියේ (2) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

එසේ වුවද ඉල්ලුම්කරු විසින් සෝදිසි වාර්තාවක් ඉදිරිපත් නොකර, ඉල්ලුම් පත්‍රය 73 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ දේශීය පරීක්ෂකවරයකුට යොමු කරන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටි විටක, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කළ හැකි බව සඳහන් කරමින් දේශීය පරීක්ෂකවරයා විසින් වාර්තාව ඉදිරිපත් කර ඇති විට හා අධ්‍යක්ෂ ජනරාල්වරයා දේශීය පරීක්ෂකවරයාගේ වාර්තාව ගැන සෑහීමට පත්වන විට, පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීමට පෙර අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැන්වීමක් පළකර,ඒ දැන්වීම පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඉකුත් වීමේ දී, අධිකරණය විසින් අන්‍යාකාර විධානයක් කරනු ලැබුවහොත් හැර, ඉල්ලුම්කරුට පේටන්ට් බලපත්‍රයක් නිකුත් කිරීමට ඉඩ තිබෙන බවට මහජනයා වෙත දැනුම් දීමක් කළ යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම වළක්වමින් අධිකරණ නියෝගයක් නැතොත් එකී තුන් මසක කාලය ඉකුත් වූ පසු අධ්‍යක්ෂ ජනරාල් විසින් පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කළහැකිය. අධ්‍යක්ෂ ජනරාල්වරයා පේටන්ට් බලපත්‍රය ප්‍රදානය කිරීම වළක්වමින් එකී තුන්මසක කාලය තුළ අධිකරණය විසින් නියෝගයක් නිකුත් කරනු ලැබුවහොත් අධිකරණය අවසාන තීරණය ගන්නාතුරු පේටන්ට් බලපත්‍රය නිකුත් නොකළ යුතු ය.

27. **ප්‍රධාන ප්‍රඥප්තියේ 83 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

83 (1) මේ කොටසේ වෙනත් විධිවිධානවලට යටත්ව සහ ඒවාට හානියක් නොමැතිව, පේටන්ට් බලපත්‍රයක වලංගු කාලය එහි ලියාපදිංචිය සඳහා ඉල්ලුම් පත්‍රය ගොනු කළ දින සිට විසි අවුරුද්දකට පසු අවසන් විය යුතු ය.

(2) පේටන්ට් බලපත්‍රයක් ප්‍රදානය කරන ලද දින සිට දෙවන අවුරුද්ද ඉකුත් වූ විට එය බලාත්මකව තබා ගැනීමට පේටන්ට් බලපත්‍රලාභියා අදහස් කරන්නේ නම්, දෙවන අවුරුද්ද සහ පේටන්ට් බලපත්‍රය වලංගු කාලසීමාව ඇතුළත වූ එක් එක් අනුප්‍රාප්තික අවුරුද්ද ඉකුත් වන දිනයට පෙර, නියමිත වාර්ෂික ගාස්තුව ඔහු විසින් ගෙවිය යුතු ය :

එසේ වුවද නියම කරනු ලැබිය හැකි යම් අධි ගාස්තුවක් ගෙවනු ලැබූ විට, එසේ කාලය ඉකුත් වූ දිනයෙන් පසු, මාස හයක අනුග්‍රහ කාල සීමාවක් සඳහා ඉඩ දිය යුතු ය :

එසේම තවදුරටත්, නියමිත වාර්ෂික ගාස්තුවල එකතුව සම්පූර්ණයෙන් හෝ ඉන් යම් කොටසක් හෝ පේටන්ට් බලපත්‍රලාභියා විසින් කලින් ගෙවනු ලැබිය හැකි ය.

(3) ඉහත සලසා ඇති ප්‍රතිපාදන ප්‍රකාරව වාර්ෂික ගාස්තුව ගෙවා නොමැති විට අදාළ වාර්ෂික ගාස්තුව ගෙවිය යුතු දින සිට පේටන්ට් බලපත්‍රය අවලංගු වූවා සේ සැලකිය යුතු ය.

28. **ප්‍රධාන ප්‍රඥප්තියේ 84 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(ඇ) අවසර ගිවිසුම්වලට ඇතුලුවීමට.

29. **ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(3) ලකුණක්, ස්වාභිමත හෝ කාල්පනික සංඥා නාම, නාම, ව්‍යාජ නාම, භූගෝලීය නාම, උද්යෝග පාඨ, උපක්‍රම, ප්‍රලම්භතාවන්, අකුරු, අංක, ලේබල, කවර, විග්න, මුද්‍රණ, මුද්‍රා, සීල්, සලකුණු, ලතාකර්ම, වාට්, ගැට් සහ දාර, වර්ණ සංයෝග කිරීම් හෝ සංයෝජනය කිරීම් හා භාණ්ඩවල හෝ බඳුන්වල හැඩයන් ආදියෙන් සමන්විත විය හැකි ය.

30. **ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(එ) යම් රාජ්‍යයක හෝ රාජ්‍යයන් අතර වූ යම් අන්තර්ජාතික සංවිධානයක හෝ අන්තර්ජාතික සම්මුතියක් මගින් පිහිටුවන ලද යම් සංවිධානයක නිසි බලධරයා විසින් බලය දෙනු ලැබුවහොත් හැර, ඒ රාජ්‍යයේ හෝ සංවිධානයේ වංශ ලකුණු, ද්වජ හෝ වෙනත් විග්න, මුල් අකුරු, නම් හෝ සංක්ෂිප්ත නම් ප්‍රතිනිෂ්පාදනය හෝ අනුකරණය කරන ලකුණක් ;

31. **ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(අ) ප්‍රස්තුත ලකුණ එම භාණ්ඩ හෝ සේවා සඳහා භාවිතා කිරීමේ දී මහජනයා නොමඟ යාමට ඉඩකඩ ඇති සර්වසම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් තුන්වන පාර්ශවයක් විසින් දැනටමත් වලංගු ලෙස අයදුම්කර ඇති හෝ ලියාපදිංචි කර ඇති හෝ තුන්වන පාර්ශවයක් විසින් තදන්තරව වලංගු ලෙස ප්‍රමුඛතාවයට හිමිකම්පාමින් අයදුම්කර ඇති හෝ ලකුණකට මහජනයා නොමඟ යාමට ඉඩකඩ ඇති ආකාරයට සමාන ලකුණක් ;

32. **ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(ඇ) (i) එය, තෙවන පාර්ශවයකගේ සර්වසම හෝ සමාන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් වූ ශ්‍රී ලංකාවේ සුප්‍රසිද්ධ ලකුණකට හෝ වෙළෙඳ නාමයකට සර්වසම හෝ නොමඟ යවන සුලු ලෙස සමාන වන්නේ නම් හෝ එවන් සුප්‍රසිද්ධ ලකුණක හෝ වෙළෙඳ නාමයක පරිවර්තනයකින්, එක් භාෂාවක ශබ්දයක් වෙනත් භාෂාවක වචනවලින් ලියා දැක්වීමකින් හෝ පිටපත් කිරීමකින් සංයුක්ත වන්නේ නම්; හෝ

(ii) එබඳු සුප්‍රසිද්ධ ලකුණක්, ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කර ඇති භාණ්ඩ හෝ සේවාවලට සර්වසම නොවන හෝ සමාන නොවන භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇති නම්; එසේ වුව ද මෙම දෙවන අවස්ථාවේ දී එම භාණ්ඩ හෝ සේවා සම්බන්ධයෙන් ලියාපදිංචිය අයදුම් කර ඇති ලකුණ භාවිතා කිරීමෙන් එකී සුප්‍රසිද්ධ ලකුණෙහි හිමිකරුගේ භාණ්ඩ හෝ සේවා හා අයදුම්කර ඇති ලකුණෙහි භාණ්ඩ හෝ සේවා අතර සම්බන්ධයක් ඇති බව පෙන්නුම් කිරීම හා එම භාවිතා කිරීමෙන් එකී සුප්‍රසිද්ධ ලකුණෙහි හිමිකරු උනන්දුවක් දක්වන කරුණුවලට හානියක් වීමේ හැකියාවක් පැවතීම අවශ්‍ය වන්නේය.

33. **ප්‍රධාන ප්‍රඥප්තියේ 161 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) (i) කෘෂි නිෂ්පාදනයක්, ආහාරයක්, වයින් හෝ ස්ප්‍රීතු ඇතුලුව ප්‍රස්තුත භාණ්ඩ එහි සත්‍ය සම්භව ස්ථානය නොවන වෙනත් භූගෝලීය ප්‍රදේශයක සම්භවයක් සහිත බව, එම භාණ්ඩයේ භූගෝලීය සම්භවය සම්බන්ධයෙන් මහජනයා නොමඟ යවන සුලු ආකාරයෙන්, පෙන්නුම් කරන හෝ යෝජනා කරන අයුරින් එම භාණ්ඩය නම් කිරීමේ දී හෝ ඉදිරිපත් කිරීමේ දී යම් උපක්‍රමයක් යෙදීම වැළැක්වීමට;

(ii) මෙම පනතේ 160 වගන්තියේ අර්ථානුකූලව අසාධාරණ තරඟකාරී ක්‍රියාවක් සංයුක්ත වන යම් භූගෝලීය දර්ශකයක භාවිතයක් වැළැක්වීමට; හා

(iii) ප්‍රස්තුත භූගෝලීය දර්ශකයෙන් පෙන්නුම් කරන ස්ථානයෙහි සම්භවය නොමැති කෘෂි නිෂ්පාදන, ආහාර, වයින් හෝ ස්ප්‍රීතු ඇතුලු භාණ්ඩ හැඳින්වීම සඳහා එම භූගෝලීය දර්ශකය භාවිතා කිරීම; හෝ භාණ්ඩවල සත්‍ය සම්භවය සඳහන්ව තිබෙන අවස්ථාවක වුව ද, නැතහොත් භූගෝලීය දර්ශකය පරිවර්තනයෙහි ලා යොදා ඇති හෝ "වර්ගය", "මෝස්තරය", "පන්නය", "අනුකරණය" හෝ ඒ හා සමාන යෙදුමක් සහිත අවස්ථාවක වුව ද, ප්‍රස්තුත භූගෝලීය දර්ශකයෙන් දැක්වෙන ස්ථානයෙහි සම්භවය නොමැති භාණ්ඩ හැඳින්වීම සඳහා භූගෝලීය දර්ශකය භාවිතා කිරීම; වැළැක්වීමට;

ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කවර හෝ පාර්ශවයකට හිමිකම තිබිය යුතු ය.

34. **ප්‍රධාන ප්‍රඥප්තියේ 170 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(1) මේ පනත යටතේ පිළිගත් ඕනෑම අයිතිවාසිකමක් දරණ පුද්ගලයෙකු විසින් තම අයිතිවාසිකමක් යම් පුද්ගලයෙකු විසින් උල්ලංඝණය කිරීමේ තර්ජනයක් පවතින බව හෝ උල්ලංඝණය කර තිබෙන බව හෝ උල්ලංඝණය වීමට ඉඩ ඇති ආකාරයේ ක්‍රියාවන්හි යෙදෙමින් සිටින බව හෝ අධිකරණය සෑහීමට පත්වන ආකාරයෙන් ඔප්පු කරනු ලැබූ විට, එකී පුද්ගලයා විසින් එම උල්ලංඝණය ආරම්භ කිරීම හෝ පවත්වාගෙන යාම හෝ ක්‍රියාවන්හි යෙදීම වළක්වන ඉන්ජංක්ෂන් තහනමක් නිකුත් කිරීමට ද, අලාභ වන්දි නියෝග කිරීමට ද, සාධාරණ සහ යුක්ති සහගත යයි අධිකරණයට පෙනී යන වෙනත් සහන ලබා දීමට ද අධිකරණයට හැකි ය. අලාභ වන්දි ලබා දීමේ නියෝගය සමඟ ඉන්ජංක්ෂන් තහනම ලබා දිය හැකි අතර, ඉල්ලුම්කරුට අලාභ වන්දි ලබා ගැනීමට හිමිකම තිබීමේ හේතුව නිසාම ඉන්ජංක්ෂන් තහනම ලබාදීම ප්‍රතික්ෂේප නොකළ යුතු ය.

35. **ප්‍රධාන ප්‍රඥප්තියේ 200 වන වගන්තියේ (3) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කරමින් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ.**

(3) ශ්‍රී ලංකාව තුළ වාසය කරන තම ස්වාමියාගේ උපදෙස් පරිදි සත්භාවයෙන් ක්‍රියාකරන සහ චෝදක විසින් හෝ ඒ වෙනුවෙන් හෝ කරන ලද ඉල්ලීමක් අනුව තම ස්වාමියා පිළිබඳ සම්පූර්ණ තොරතුරු සපයන යම් සේවායෝජකයෙකු අපරාධ නඩුවකට හෝ දඬුවමකට යටත් වන බවට මේ කොටසේ අන්තර්ගත කිසිවක් අර්ථකථනය නොකළ යුතු ය.